# උත්ථාන සමයේ සයවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 18: 9–18

### “මට මේ නුවර බොහෝ සෙනඟ සිටිතී”

ස්වාමින් වහන්සේ රාත්‍රියේදී දර්ශනයකින් පාවුලුට කතා කොට “ඔබ භය නොවී නිශ්ශබ්දව නොසිට කතා කරන්න. මන්ද මම ඔබ සමඟ සිටිමි. ඔබට අනතුරු කරන ලෙස කිසිවෙක් ඔබට විරුද්ධව නොඑන්නේය. මට මේ නුවර බොහෝ සෙනඟ සිටිති’ යි වදාළ සේක. ඔහු දෙවියන් වහන්සේගේ වචනය ඔවුන් අතර උගන්වමින් එක් අවුරුදු සමසක් එහි වාසය කළේය. එහෙත් ගලියෝ අකයියාවේ අධිපතියාව සිටියදී ජුදෙව්වරුන් එක්සිත්ව පාවුලුට විරුද්ධව නැගී සිට, ඔහු විනිශ්චයාසනය ඉදිරියට ගෙනැවිත් ‘මොහු ව්‍යවස්ථාවලියට විරුද්ධව දෙවියන් වහන්සේට නමස්කාර කරන්නට මිනිසුන් පොළඹවන්නේය’ යි පැමිණිලි කළහ. පාවුලු කථා කරන්නට සැරසෙන විට ගලියෝ ජුදෙව්වරුන් අමතමින් ‘ජුදෙව්වරුනි, මේ කාරණය අපරාධයක්වත් නපුරු දුෂ්ඨකමක්වත් වී නම් මා ඔබේ පැමිණිල්ලට සවන් දිය යුතුමය. එහෙත් මේ වනාහි ඇතැම් වචන ගැන ද ඇතැම් නාම ගැන ද ඔබගේම ව්‍යවස්ථාවලිය ගැන ද වූ ප්‍රශ්න වන බැවින් ඒ ගැන ඔබම වග බලා ගන්න. මේ දේවල් ගැන මම විනිශ්චයකාරයෙක් නොවන්නෙමි’ යි කියා ඔවුන් නඩු ආසනය වෙතින් එළවා දැමුවේය. එවිට ඒ සියල්ලෝ ධර්ම ශාලාවේ මුලැදෑනියා වූ සොස්තෙනේස් අල්ලා නඩු ආසනය ඉදිරියේ ඔහුට තැළුහ. එහෙත්

ගලියෝ මේ ගැන සැලකුවේ නැත. පාවුලු එහි තවත් කලක් නැවතී සිට පසු සහෝදරයන්ගෙන් සමු ගෙන සිරියාවට යන්නට නැව් නැංගේය. ප්‍රිස්කිලා ද අකිලා ද එතුමා සමඟ ගියහ. පාවුලු බාරයක් වී සිටි බැවින් කෙන්ක්‍රෙයායේ දී හිස මුඩු කර ගත්තේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 47 : 1–6

පිළිතුර: දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝ ය.

ගීය:

සව් සතුනි, අත් පොළොසන් දෙන්න.
ජය ගොස නංවා දෙවිඳුන්ට තුති දෙන්න.
අති උතුම් සමිඳාණෝ බියකරු ය.
මුළු මහ පොළොව කෙරේ අග රජ ය.

එතුමාණෝ ජාතීන් පරදා අපට ජය දුන් සේක.
සව් සත කෙරේ අග රජ වන සේක.
තම හට ප්‍රිය ජාකොබ්ගේ සෙනඟ වන අප හට
මවූ බිමක් ලබා දුන් සේක.

ජය ගොඩ නංවා කාහල හඬ පතුරා,
එතුමාණෝ සහසුන මත නැගුණ සේක.
දෙවිතුමන් හට ගී පසස් නගන්න.
අපේ නිරිඳු හට ගී පසස් නගන්න.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මාගේ නාමයෙන් පියාණන් වහන්සේ එවන
සහායදායකයාණන් වහන්සේ
එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ සියල්ල ඔබට උගන්වමින්
මා වදාල සියල්ල ඔබට සිහිපත් කරවන සේක."
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 16 20–23:

**"ඔබේ ප්‍රීතිය කිසිවෙක් ඔබෙන් පැහැර නොගන්නේය."**

"ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. ඔබ හඬා වැලපෙන්නහු ය. එහෙත් ලෝකයා ප්‍රීති වන්නාහ. ඔබ දොම්නස් වන නමුත් ඔබේ දොම්නස සොම්නසට හැරෙනු ඇත. ස්ත්‍රියකට ප්‍රසව මොහොත පැමිණි කල ඇගේ වේලාව පැමිණ තිබෙන බැවින් ඇට දුක් වේදනා ඇතිවේ. එහෙත් ඈ දරුවා බිහි කළ පසු ලෝකයට දරුවෙක් උපන්නේය යන ප්‍රීතිය නිසා වේදනාව අමතක කරන්නීය. එමෙන්ම ඔබ දැන් ශෝක වන්නහුය. එහෙත් නැවත මම ඔබ දකින්නෙමි. එවිට ඔබේ සිත් ප්‍රීතියෙන් පිනා යයි. ඔබේ ප්‍රීතිය ද කිසිවෙක් ඔබෙන් පැහැර නොගනිති.

“ඒ දවසේ දී ඔබ කිසි ප්‍රශ්නයක් මාගෙන් අසන්නේ නැත. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් යමක් ඉල්ලුවොත් උන්වහන්සේ ඒ දේ ඔබට දෙන සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.